## සංක්ෂිප්තය

පරිගණක තාක්ෂණය ලෝකයේ සීඝ්‍ර දියුණුවක් මෙන්ම සීඝ්‍ර වෙනස්වීම්ද ඇතිවන ක්ෂේත්‍රයක් බවට වර්තමානයේ පත්ව ඇත. ලෝකයේ අනෙකුත් රටවල් ඉදිරියට ඇදෙන වේගයෙන්ම, ඒ සම්බන්ධව ශ්‍රී ලංකාවද ඉදිරියට ගමන්කිරීමේ අවශ්‍යතාව වර්තමානයේ පැනනැගී ඇත. ඒ සඳහා මුහුණදිය යුතු පිරිස පාසල් අධ්‍යාපනය නිමාවන විට බිහිවී සිටිය යුතුය. එම අවශ්‍යතාව ඉටුකරලීම සඳහා ජාතික අධ්‍යාපන ආයතනය හා අධ්‍යාපන අමාත්‍යාංශය එක්ව, එක් එක් අධ්‍යාපන කලාපවල පාසලක් ආශ්‍රිතව කලාපීය පරිගණක සම්පත් මධ්‍යස්ථානය බැගින් පිහිටුවා ඇත. මේ අධ්‍යයනය පරිගණක සම්පත් මධ්‍යස්ථානවල ක්‍රියාකාරිත්වය පිළිබඳවය.

### අධ්‍යනයයේ අරමුණු වූයේ

1. පාසල් පරිගණක සම්පත් මධ්‍යස්ථානවල ප්‍රධාන කාර්යභාරය කුමක්දැයි සොයා බැලීම.

2. පරිගණක සම්පත් මධ්‍යස්ථානවලින් සිසුනට හා ගුරුවරුනට සැලසෙන ප්‍රයෝජන කවරේදැයි සොයා බැලීම.

3. පරිගණක සම්පත් මධ්‍යස්ථාන පවත්වාගෙන යාමේදී මතුවන දුෂ්කරතා කවරේදැයි සොයා බැලීම.

4. පරිගණක සම්පත් මධ්‍යස්ථාන පවත්වාගෙන යාමේදී මතුවන දුෂ්කරතා අවම කිරීමට ගතයුතු පියවර යෝජනා කිරීම.

යන ඒවායි.

මෙම පර්යේෂණයේදී පරිගණක සම්පත් මධ්‍යස්ථානයේ උපදේශකවරුන් ලෙස සේවය කරන ගුරු මහත්ම මහත්මීන් හා මධ්‍යස්ථානවල පාඨමාලා හදාරන ශිෂ්‍ය ශිෂ්‍යාවන් වෙත යොමුකරන ලද ප්‍රශ්නාවලි මගින්ද පරිගණක සම්පත් මධ්‍යස්ථානයේ කළමනාකරුවන් 3 දෙනා සමඟ සම්මුඛ සාකච්ඡා පැවැත්වීමෙන් හා එහි පවත්වාගෙන යනු ලබන වාර්තාගත ලේඛන පරීක්ෂා කිරීමෙන්ද දත්ත ලබාගෙන, විශ්ලේෂණය කොට අනාවරණ ඉදිරිපත් කරන ලදී.

සාමාන්‍ය පෙළ හෝ උසස් පෙළ විභාගයේ ප්‍රතිඵල ලැබෙන තෙක් සිටින සිසුන්ට මූලික පරිගණක දැනුම ලබාදීම හා රජය මගින් ක්‍රියාත්මක කරන පරිගණක පුහුණු වැඩසටහන්වලට අනුව ගුරුවරුන් පුහුණු කිරීම මෙම මධ්‍යස්ථානවල මූලික කාර්යභාරයවේ.

අනාගත වැඩ ලෝකය සඳහා සිසුන්ට අවශ්‍යවන නිපුණතාව ලබාදීමටත් ගුරුවරුන්ගේ නව ඉගැන්වීම් ක්‍රම දියුණු කිරීම සඳහාත්, ගුරු පුහුණුව අදි ඉලක්ක සපුරා ගැනීමටත් පරිගණක සම්පත් මධ්‍යස්ථාන දායකකරගත හැකිය.

මධ්‍යස්ථාන සම්පූර්ණයෙන්ම නඩත්තු වන්නේ සිසුන්ට පැවැත්වෙන පාඨමාලාවලින් ලැබෙන ආදායමිනි.

ගුරු පුහුණුව ප්‍රමාණවත් නොවීමද, පාඨමාලාව අවසානයේ සිසුන් ලබාගත් දැනුම රාජ්‍ය මට්ටමින් නිසි ඇගයීමකට ලක් නොකිරීමද පරිගණක සම්පත් මධ්‍යස්ථානයේ ඇති පරිගණක සංඛ්‍යාව ප්‍රමාණවත් නොවීමද, පාඨමාලා පවත්වාගෙන යාමේදී ගුරුවරුන්ට මෙන්ම සිසුන්ටද ඇති ප්‍රධාන දුෂ්කරතාය.

ගුරු පුහුණුව විධිමත් කර, අවශ්‍ය පහසුකම් ලබාදී, රාජ්‍ය මට්ටමින් නිසි අවධානයකට හා අධීක්ෂණයකට ලක්කර මධ්‍යස්ථාන නිරන්තර විගනණයකටද භාජනය කරන්නේ නම් මෙම මධ්‍යස්ථානවල ක්‍රියාකාරිත්වය ප්‍රශස්ථ මට්ටමකට ගෙනඒමට හැකිය.